මාධ්‍ය නිවේදන අංක **24**

**මැතිවරණ කොමිෂන් සභාව**

**මාධ්‍ය නිවේදනය**

මැතිවරණ කොමිෂන් සභාව, පාර්ශ්වකාර කණ්ඩායම් සහ තරුණ කණ්ඩායම් දීර්ඝ කලක සිට අපේක්ෂා කරන ලද වයස අවුරුදු 18 සම්පූර්ණ වූ යෞවන යෞවනියන්ට ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි වී, රටේ පාලන බලයට හවුල් වීමට අවස්ථාව ලැබෙන පරිදි ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත 2021.10.07 දින පාර්ලිමේන්තුවේ දී සම්මත කරනු ලැබ ඇත.

මෙම පනත් කෙටුම්පත සම්මත වීම තුළින් ඒ පිළිබඳව සුවහසක් බලාපොරොත්තු තැබූ රටේ අනාගත භාරකරුවන් වන යෞවන යෞවනියන්ගේ ජයග්‍රහණයක් මෙන්ම ඔවුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කිරීමක් ද වේ.

එබැවින් මෙම පනත් කෙටුම්පත සම්මත කොට බලාත්මක කිරීම සඳහා සහාය දැක්වූ සියළුම පාර්ශ්වයන්ට, විශේෂයෙන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කථානායකතුමා, සභානායකතුමා, විපක්ෂනායකතුමා ඇතුළු සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා, නීතිපති දෙපාර්තමේන්තුවේ සහ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය සහ නන් අයුරින් සහාය දැක්වූ සැමට මැතිවරණ කොමිෂන් සභාවේ ස්තූතිය පළ කිරීමට 2021.10.08 දින රැස්වූ මැතිවරණ කොමිෂන් සභාව තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්
මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2021 ඔක්තෝබර් මස 08